# විධායක සාරාංශය

## ව්‍යාපෘති දළ විශ්ලේෂණය

ලංකා විදුලි බල මණ්ඩලය (ලංවිම) විසින් යෝජිත සාම්පූර් එකතු ග්‍රිඩ් උපපොළේ (Sampur CGS) සිට ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙහි පිහිටි කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළ (Kappalthurai GS) දක්වා කි.මී. 37.6 ක් දිගින් යුත් 220kV අධි වෝල්ටීයතා සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීමට සැළසුම් කර ඇත. මෙය උපායමාර්ගික යටිතල පහසුකම් ව්‍යාපෘතියක් වන සාම්පූර් සූර්ය බලශක්ති උද්‍යානයෙන් ජනනය වන විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා සැලසුම් කරන ලද්දකි. සාම්පූර් සූර්ය බලශක්ති උද්‍යානය අදියර 1 මෙගාවොට් 50 ක් ලෙස සැලසුම් කර ඇති අතර පසුව මෙගාවොට් 120 දක්වා පුළුල් කෙරේ. පුනර්ජනනීය බලශක්ති ධාරිතාව පුළුල් කිරීම, පොසිල ඉන්ධන මත යැපීම අඩු කිරීම සහ නැගෙනහිර පළාතේ විදුලි සැපයුම විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ සංවර්ධන ඉලක්කවලට මෙම ව්‍යාපෘතිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සපයන මෙම ව්‍යාපෘතිය, තිරසාර, දේශගුණික-ප්‍රතිරෝධී බලශක්ති යටිතල පහසුකම් වැඩිදියුනු කිරීම සඳහා ජාතික අරමුණට සහය වෙයි.

## පාරිසරික හා සමාජ බලපෑම් ඇගයීමේ (ESIA) අරමුණු සහ ව්‍යාපෘති විෂය පථය

යෝජිත සම්ප්‍රේෂණ මාර්ගය, සාම්පූර් එකතු ග්‍රිඩ් උපපොළ, කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළ පුළුල් කිරීම සහ සාම්පූර් සූර්ය බලශක්ති උද්‍යානය (ඒ හා සම්බන්ධ පහසුකම්) ආශ්‍රිත පාරිසරික හා සමාජීය අවදානම් සහ බලපෑම් ක්‍රමානුකූලව හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ESIA ඇගයීමක් සිදු කර ඇත. යෝජිත සාම්පූර් එකතු ග්‍රිඩ් උපපොළ සිට කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළ දක්වා දිවෙන 220kV සම්ප්‍රේෂණ මාර්ගය කිලෝමීටර 37.6 ක දිගකින් යුක්තය. පවතින කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළේ වපසරිය හෙක්ටයාර 6.8037 (අක්කර 16.8123) ක් වන අතර යෝජිත සාම්පූර් එකතු ග්‍රිඩ් උපපොළ සඳහා වෙන් කර ඇති ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර 8.4 (අක්කර 20.75) කි. ව්‍යාපෘතියට සම්බන්ධ පහසුකමක් වන සූර්ය බලශක්ති උද්‍යානය හෙක්ටයාර 204.3663 (අක්කර 505) කින් සමන්විත වේ. ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ ජාතික පාරිසරික රෙගුලාසි මෙන්ම AIIB පාරිසරික හා සමාජ රාමුවේ (ESF) ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරගැනීමේ ප්‍රධාන මෙවලම ලෙස ක්‍රියා කරයි. සාම්පූර් සූර්ය විදුලි ව්‍යාපෘතිය ඇතුළුව ව්‍යාපෘතියේ සියළු ඉදිකිරීම්වලින් සිදුවන සමස්ත පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීමේ සැලසුම් හා ක්‍රියාමාර්ග මෙහි ඇතුළත් වේ.

## ව්‍යාපෘතියේ සාධාරණීකරණය

පසුගිය දශක දෙක තුළ, ශ්‍රී ලංකාවේ නාගරීකරණය පුළුල් වීම, කාර්මික අංශයේ වර්ධනය සහ ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය වැඩිවීම හේතුවෙන් වාර්ෂිකව 5-6% ක විදුලි ඉල්ලුමේ අඛණ්ඩ වැඩිවීමක් දක්නට ලැබේ. මෙම ඉල්ලුම තිරසාර ලෙස සපුරාලීම සඳහා, රජය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දී ඇත. යෝජිත 120MW සාම්පූර් සූර්ය බලශක්ති උද්‍යානය, ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇත. මෙම සූර්ය බලාගාරයෙන් විදුලිය සම්ප්‍රේෂණය කිරීම සහ ජාතික ජාල පද්ධතිය හරහා අවසාන පාරිභෝගිකයන්ට විශ්වාසදායක ලෙස බෙදා හැරීම සඳහා යෝජිත සම්ප්‍රේෂණ මාර්ගය ඉතා වැදගත් වේ. මෙම සම්ප්‍රේෂණ මාර්ගය නොමැතිව, සූර්ය බල උද්‍යානය ඉදිකිරීම ශක්‍ය නොවනු ඇත, ව්‍යාපෘතිය මෙම සූර්ය බලශක්ති ව්‍යාපෘතියට පමණක් නොව රටේ බලශක්ති අනාගතයට අත්‍යවශ්‍ය වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් දේශීය සහ AIIB ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන බැවින්, එහි පාරිසරික බලපෑම අවම වනු ඇත. එබැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සාධාරණ සහ යුක්ති සහගත වේ.

## පරිසර සහ සමාජ මූලික තත්ත්වයන්

ව්‍යාපෘති ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ඊසානදිග වියළි හා ශුෂ්ක පාරිසරික කලාපයට අයත් වන අතර වගා කරන ලද කුඹුරු, අතහැර දැමූ කෘෂිකාර්මික ඉඩම්, වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, මුඩු ඉඩම්, ගංගා පරිසර පද්ධති සහ ලඳු කැලෑ ඇතුළු විවිධ භූ විෂමතාවලින් සමන්විත වේ. මෙම ප්‍රදේශය ආවේණික ශාක සහ සත්ව විශේෂ කිහිපයක් සඳහා වාසස්ථාන සපයයි. එහෙත් සම්ප්‍රෙෂණ මාර්ගය කිසිම ප්‍රධාන ජෛව විවිධත්ව පාරිසරික ප්‍රදේශයක් ඔස්සේ ගමන් නොකරයි. සමාජ-ආර්ථික සන්දර්භය ප්‍රධාන වශයෙන් ග්‍රාමීය වන අතර ජීවනෝපාය බොහෝ දුරට කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ ධීවර කර්මාන්තය මත රඳා පවතී. ආගමික ස්ථාන, ප්‍රජා මධ්‍යස්ථාන සහ පොදු මාර්ග වැනි මූලික සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රදේශයේ සහ එහි බලපෑම් පවතින ප්‍රදේශ තුළ සුළු වශයෙන් පවතී. ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතන රටාව අනුව ඇතිවන ගංවතුර තත්වයන් එම ප්‍රදේශයෙ ග්‍රාමීය ජනයාගේ ජීවිතවල සාමාන්‍ය ලක්ෂණයකි. ව්‍යාපෘත්යේ මූලික සැලසුම් සකස් කිරීමේදී ප්‍රදේශයේ ජනතාවගේ

අවශ්‍යතා සහ යෝජනා සැලකිල්ලට භාජනය කල අතර ප්‍රාදේශීය සහ ජාතික ආයතන සමග පැවතුනු සාකච්ඡා හා දැනුවත් කිරීම් මගින් ගැටළු හොඳින් විමර්ශණය කර ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව අධීක්ෂණය සහ ඇගයීම කර ඇත.

## ප්‍රධාන පාරිසරික හා සමාජීය බලපෑම්

**භෞතික පරිසරය:**

ඉදිකිරීම් අවධියේදී, විභව බලපෑම් අතරට දූවිලි උත්පාදනය, ශබ්ද දූෂණය, වාතයේ සහ ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම ඇතුළත් වේ. විශේෂයෙන් ප්‍රවේශ මාර්ග සහ කුළුණු අත්තිවාරම් ඉදිකිරීමේදී පරිසර හානි අවම කිරීමේ පියවර නිසි ලෙස ක්‍රියාත්මක නොකළහොත්, පාංශු ඛාදනය සහ මතුපිට ජලය ගලා යාමේ වේගය වැඩි විය හැකිය. ගංවතුර ඇතිවීම ප්‍රදේශයේ මූලික පාරිසරික ලක්ෂණයක් වුවද, ව්‍යාපෘති මැදිහත්වීම් හේතුවෙන් ගංවතුර උග්‍රවීම නොසැලකිය හැකිය. ඉදිකිරීම් අතරතුර ජලාපවහන මාර්ගවලට බාධා ඇති විය හැකි බැවින් හොඳින් සැලසුම් කරන පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්මක් (ESMP) හරහා නිවැරදි ඉංජිනේරු තාක්ෂණය භාවිතයන් සහ ස්ථානීය පාරිසර පාලනයන් හරහා මෙම අවදානම අවම කරනු ලැබේ.

**ජීව විද්‍යාත්මක පරිසරය:**

සම්ප්‍රේෂණ මාර්ගය ජාතික සංරක්ෂිත ප්‍රදේශයක් හෝ ප්‍රධාන ජෛව විශේෂ ප්‍රදේශයක් ඔස්සේ ගමන් නොකරයි. නමුත් සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී ගස් 454 ක් පමණ ඉවත් කිරීමට සිදුවේ. ජෛව විවිධත්වයට ඇති විය හැකි බලපෑම් නැවත වන රෝපනය, වාසස්ථාන සංරක්ෂණය සහ අඛන්ඩ ජෛව විවිධත්ව නිරීක්ෂණය ඔස්සේ අවම කිරීමට සැලසුම් කර ඇත.

**ජල සම්පත්:**

සම්ප්‍රේෂණ මාර්ගය, මහවැලි ගංගා ද්‍රෝණිය, කුඩා වැව්, ඇල මාර්ග, කුඩා ජල ප්‍රවාහ හරහා ගමන් කරයි. ජලජ පරිසර පද්ධති සහ ඇළ දොළ වලට සිදුවන බාධා අවම කිරීම සඳහා කුළුණු ස්ථානගත කිරීම ප්‍රශස්ත ලෙස සිදු කර ඇති අතර, ඉදිකිරීම් අතරතුර මනා තත්ව පාලනයන් සිදු කෙරේ.

**සමාජ බලපෑම්:**

සම්ප්‍රේෂණ මාර්ගය, ප්‍රධාන ලෙස ගෘහස්ථ ප්‍රදේශවල ජනතාව ප්‍රතිස්ථානගත කිරීමට හේතු නොවනු ඇත. එයට ප්‍රධානතම හේතුව ව්‍යාපෘතියේ සැළසුම්කරණ අදියරේදී ජනාවාස හරහා සම්ප්‍රේෂණ මාර්ගය නොයන ලෙස සැලසුම් කිරීමයි. නමුත් ප්‍රවේශ මාර්ග, කුළුණු පාදක සහ විදුලි රැහැන් ඉදි කිරීම සඳහා භූමිය භාවිතා කිරීම නිසා ගොවිතැන් කරන භූමි සහ ඔවුන්ගේ ජීවනෝපායයන් සඳහා සුළු බලපෑම් ඇතිවිය හැකිය. බලපෑමට ලක්වන ගොවීන් සහ ඉඩම් හිමියන් සඳහා ඉඩම් අත්කරගැනීමේ පනත, ජාතික ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP), සහ AIIB ප්‍රතිපත්තිවලට අනුකූලව වන්දි සහ හානිපූර්ණයන් සැපයීම සිදු කරනු ඇත. ප්‍රජාවේ ආරක්ෂාව, ප්‍රදේශයේ ශ්‍රම බලකාය සඳහා අවස්ථාවන් ලබා දීම සහ ඉදිකිරීම් අවස්ථාවල රථවාහන සැලසුම් සඳහා අවධානය යොමු කර ඇති අතර ඒ සඳහා පාරිසරික සමාජීය කළමණාකරන සැලැස්ම (ESMP) හි සැළසුම් දක්වා ඇත.

**සංස්කෘතික උරුමය:**

සම්ප්‍රේෂණ කොරිඩෝව තුළ හඳුනාගත් පුරාවිද්‍යාත්මක හෝ සංස්කෘතික ස්ථාන නොමැත. කෙසේ වෙතත්, ඉදිකිරීම් අතරතුර සිදුවන ඕනෑම අනපේක්ෂිත පුරාවිද්‍යාත්මක සොයාගැනීමකදී අවශ්‍ය උපදෙස් හා නිර්ණායකයන් ESMP තුළට ඇතුළත් කර ඇත.

**දේශගුණික අවදානම් සහ ඔරොත්තු දීමේ හැකියාව:**

සම්මත දේශගුණික විපර්යාස අවස්ථා (උදා: RCP 5.5 සහ 8.5) භාවිතා කරමින් ගංවතුර ආකෘති නිර්මාණය සහ දේශගුණික විපර්යාස අධ්‍යයනයන් භාවිතා කරමින් පුළුල් දේශගුණික අවදානම් තක්සේරුවක් සිදු කරන ලදී. ව්‍යාපෘති ප්‍රදේශය සෘතුමය නියඟ සහ වාර්ෂික ගංවතුරට යටත් වේ. ඒ අනුව, සම්ප්‍රේෂණ කුළුණු සහ යටිතල

පහසුකම් ආන්තික කාලගුණය, උෂ්ණත්වය ඉහළ යාම සහ ගංවතුර මට්ටම් වලට එරෙහිව දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා නිර්මාණය කර ඇත.

<u>සාම්පූර් සූර්ය විදුලි බල උද්‍යානය (ආශ්‍රිත පහසුකම්)</u>

මූලික අදියරේදී 50 MW ප්‍රමාණයෙන් සැළසුම් කර ඇති සාම්පූර් සූර්ය විදුලි උද්‍යානය, පසුව 120 MW දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත. බලශක්ති උද්‍යානය වෙන්ව සංවර්ධනය කළද, එහි ක්‍රියාකාරිත්වය ප්‍රධාන ලෙස සැලසුම් කර ඇති සම්ප්‍රේෂණ මාර්ගය මතම රඳා පවතී. සූර්ය විදුලි උද්‍යානයට අදාලව ඇති ප්‍රධාන පරිසර බලපෑම් අතර භූමි ආවරණය වෙනස්වීම, පඳුරු සහ වෘක්ෂලතා ඉවත් කිරීම, වන ජීවීන්ට ඇති වන බලපෑම් සහ ඉදිකිරීම් කාළය තුල ඇති වන කෙටිකාලීන බලපෑම් ඇතුළත් වේ. මෙම බලපෑම් හූ විශමතාවය සහ පරිසර බලපෑම් සැළකිල්ලට ගනිමින් ඇගයීම් කර ඇති අතර AIIB හි ප්‍රමිතීන් හා අවශ්‍යතා සහ ප්‍රමිතියන්ට අනුකූල බව සහතික කිරීම සඳහා ESIA හි ඇතුළත් කර ඇත.

<u>හානි අවම කිරීමේ පියවර සහ පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP)</u>

විශේෂයෙන් සමාජීය, පාරිසරික හා ජල විද්‍යාත්මක බලපෑම් අවම කිරීම සඳහා පූර්ව සැලසුම් ගැලපීම් ඇතුළුව විය හැකි බලපෑම් සමනය කිරීම සඳහා විවිධ හානි අවම කිරීමේ පියවර යෝජනා කර ඇත. බලපෑමට ලක් වූ පාර්ශවකරුවන්ට වන්දි ලබා දීම, ස්ථානීය සහ පිටත වන වගාව සහ දේශගුණික විපර්යාස බලපෑම් වලට ඔරොත්තු දීම සඳහා කුළුණ සහ රැහැන් සංරචක ශක්තිමත් කිරීම ඒ අතර වේ. ලංවිම දැනටමත් සෘජුවම බලපෑමට ලක් වූ ඉඩම් හිමියන් හඳුනාගෙන ඇති අතර, වන්දි ගෙවීමට අවශ්‍ය තොරතුරු සියල්ල රැස් කරගෙන ඇත.

ප්‍රධාන පාරිසරික බලපෑම් සහ යෝජිත හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග, වගකීම්, කාලසටහන් සහ හඳුනාගත් බලපෑම් අවම කිරීම සඳහා වන පිරිවැය දක්වමින් පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම සකස් කර ඇත. ESMP හි ප්‍රධාන අංග අතරට:

- වන වගා වැඩසටහන් සහ භූමි ප්‍රතිසංස්කරණය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි)
- පාංශු ඛාදනය අවම කිරීම සඳහා තාවකාලික බෝක්කුල පස් හෝ ගල් වැටි, තාවකාලික ජලාපවහන ව්‍යුහයන් ඉදි කිරීම  ප්‍රවේශ මාර්ග හරහා තාවකාලික බෝක්කු හරස් මාර්ග වැනි ඛාදනය සහ අවසාදිත පාලන පද්ධති සහ ඉදි කිරීම.
- මහජන සෞඛ්‍ය සහ ආරක්ෂාව, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව සහ ප්‍රජා අවදානම් කළමනාකරණ ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම
- ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී ශ්‍රම කළමනාකරණ ක්‍රියා පටිපාටි
- ව්‍යාපෘති ඉදිකිරීම් කාලය පුරාවටම අදාල විවිධ පාර්ශවකරුවන්ගේ උපදේශනය
- විනිවිද පෙනෙන සහ සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය (GRM)
- පළතුරු පැල සැපයීම, ප්‍රජා ශාලා වැඩිදියුණු කිරීම් වැනි CSR ක්‍රියාකාරකම්.

ESMP සහ ව්‍යාපෘති කාර්ය සාධන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා නිතිපතා අධීක්ෂණය පවත්වනු ලැබේ. පාරිසරික දර්ශක (වාතය, ශබ්දය, කම්පනය, ජල ගුණාත්මකභාවය), පාරිසරික සෞඛ්‍ය, සමාජ සුභසාධන මිනුම් සහ ප්‍රජාවෙන් ලැබෙන යෝජනා හා අදහස්  (ESMoP) අනුව සමාලෝචනය කර වාර්තා කරනු ලැබේ.

<u>ආයතනික විධිවිධාන</u>

ESMP ක්‍රියාත්මක කිරීම සහ අනුකූලතාවය පවත්වා ගැනීම සහතික කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා කැපවූ පාරිසරික හා සමාජ ඒකකයක් ලංකා විදුලි බල මණ්ඩලයෙන් පිහිටුවා ක්‍රියාත්මක කිරීමට නායකත්වය දෙනු ඇත. මෙම ඒකකය කොන්ත්‍රාත්කරුවන්, පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අධීක්ෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. ආයතනික ශක්තිමත් කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීම්, ඵලදායි අධීක්ෂණය සහ කළමනාකරණයට සහාය වනු ඇත. AIIB මාර්ගෝපදේශවලට ගොඩනගා ඇති තෙවන පාර්ශවීය අධීක්ෂණ යාන්ත්‍රණයක් කාර්ය සාධනය නිරීක්ෂණය සඳහා යොදා ගනු ලැබේ.

## <u>පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය</u>

ප්‍රාදේශී ප්‍රජාවන්, පරිපාලන ඒකක (දිස්ත්‍රික් ලේකම් කාර්යාල. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි), පරිසර පාලන ආයතන (වන හා ජීව විවිධත්ව ආරක්ෂණ ඒකක ඇතුළු), සහ සිවිල් සමාජ නියෝජිතයන් සමඟ පුළුල් සංවාද සිදුකර ඇත.පරිසර නියාමන බලධාරීන්, වන හා වනජීවී බලධාරීන් ඇතුළු පරිසර නියාමන බලධාරීන් සහ සිවිල් සමාජ නියෝජිතයින් මතු කරන ලද ගැටළු අතරට ගෙවතු සහ කුඹුරුවල ඉඩම් සහ වෘක්ෂලතා/බෝග හානි සඳහා මූල්‍යමය වන්දි අවශ්‍යතා, ප්‍රවේශ බාධා සහ ගස් ඉවත් කිරීම වැනි විභව පාරිසරික කැළඹීම් ඇතුළත් විය. මෙම ගැටළු අවම කිරීමේ පියවර සහ හානි පූර්ණ යෝජනා ESMP තුළට ඇතුළත් කර ඇති අතර, දුක්ගැනවිලි ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම, ආමන්ත්‍රණය කිරීම සහ අවම කිරීම සහතික කිරීම සඳහා GRM ස්ථාපිත කර ඇත. ශක්තිමත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට මෙම දුක්ගැනවිලි කළමනාකරණය කිරීමට සහ ඵලදායී ලෙස විසඳීමට හැකි වනු ඇත.

## <u>නිගමන සහ නිර්දේශ</u>

මෙම ESIA ඇගයීමෙන් නිගමනය කරන්නේ සාම්පූර් එකතු ග්‍රිඩ් උපපොල, කප්ලතුරෙයි ග්‍රිඩ් උපපොල සහ සාම්පූර් සූර්ය උද්‍යානය ඇතුළුව යෝජිත 220kV සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය, යෝජිත හානි අවම කිරීමේ පියවර නිසි ලෙස ක්‍රියාත්මක කිරීමත් සමඟ පාරිසරික වශයෙන් සහ සමාජීය මට්ටමෙන් කාර්යක්ෂම හා තිරසාර ලෙස කළ හැකි බවයි. ආපසු හැරවිය නොහැකි බලපෑම් අපේක්ෂා නොකරන අතර, ESMP ඇතුළත් වාර්තාවේ දක්වා ඇති යෝජිත හානි අවම කිරීමේ පියවර හරහා සියලු විභව අහිතකර බලපෑම් ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකිය. මෙම ව්‍යාපෘතිය තුළින් පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය වැඩි දියුණු කිරීමත්, නැගෙනහිර පළාතේ ජාලක විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමත්, සහ ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති ඉලක්ක සඳහා අර්ථවත් හා කාලෝචිත දායකත්වයක් ලබාදීමත් සිදු කෙරෙනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ක්‍රම අනුගමනය කිරීම නිර්දේශ කරනු ලැබේ:

- පරිසර හා සමාජ ආරක්ෂා ක්‍රම දැඩිව අනුගතවීම
- පාර්ශවකරුවන් සමඟ අඛන්ඩ සම්බන්ධතා
- ශක්තිමත් ආයතනමය සම්බන්ධතා
- සම්පූර්ණ නිරීක්ෂණ සහ අනුකූල කළමනාකරණ ක්‍රියාමාර්ග

AIIB ESF මාර්ගෝපදේශයන්ට අනුව සහ NEA යටතේ ව්‍යාපෘතිය 'B' කාණ්ඩයට අයත් වන බැවින්, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) වෙත ඉදිරිපත් කරන ලද මූලික පාරිසරික අධ්‍යයනය(IEE) මත පදනම්ව, 2023 දෙසැම්බර් මාසයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් කොන්දේසි සහිත අනුමැතිය ලබා දී ඇත. එබැවින්, උපදේශකයින් AIIB අරමුදල් සඳහා ව්‍යාපෘතිය අනුමත කරන ලෙස යෝජනා කර ඇත.